ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය

නීතිවේදී උපාධි පාඨමාලාව – 3 වන මට්ටම

දෙවන අඛණ්ඩ ඇගයීම් පරීක්ෂණය – 2008/2009

නීති ක්‍රම – LWU 1412

කාලය – විනාඩි 40 යි

---

දිනය: 26.11.2008 වේලාව: පෙ. ව. 09.30 සිට 10.10 දක්වා

---

එක් ප්‍රශ්ණයකට පමණක් පිළිතුරු සපයන්න

අපැහැදිලි අත් අකුරු වලට ලකුණු අඩු කරනු ලැබේ

1. "විශේෂ කරුණු සම්බන්ධයෙන් පූර්වයෙන් පැනවූ ව්‍යවස්ථාවකට අදාල වන ලෙස දීර්ඝ කිරීමකින් තොරව පසුව පැනවූ පනතක වචන සාධාරණ ලෙස හා ප්‍රඥාගෝචර ලෙස අදාල කර ගත හැකි නම්, එවැනි සාමාන්‍ය වදන්වල බලය නිසාම පූර්වයෙන් වූ හෝ විශේෂිත වූ ව්‍යවස්ථාව වක්‍රාකාරයෙන් අවලංගු කිරීම, වෙනස් කිරීම හෝ හීන කිරීමක් සිදු නොවන බව ස්ථිරය. …" **Selborne L C** සාමිවරයා, **The Vera Cruze (1884) 10 AC 5** හිදි .

   ශ්‍රී ලංකාවේ අධිකරණ මගින් දෙන ලද තීරණ කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් ඉහත දක්වන ලද ආප්තය අධිකරණය මගින් අදාල කර ගත් ආකාරය විවේචනාත්මකව විභාග කරන්න.

2. ප්‍රියා පළමු වසරේ නීති ශිෂ්‍යයෙකි. අනුගම්‍ය පූර්ව නිදර්ශන න්‍යාය පිළිබඳ හොඳින් නොදන්නා ඔහු අභියාචනාධිකරණය විසින් 2006 වසරේදී තීරණය කරන ලද A, B, C, සහ D යන කරුණු මත පදනම් වූ පෙරේරා එ. පෙරේරා යන නඩු තීරණය පිළිබඳ අධ්‍යයනය කරයි. වර්තමාන ශ්‍රේෂ්ඨාධිකරණය වෙනත් අධිකරණ විසින් දෙන ලද තීරණයන්ගෙන් බැඳී නොසිටින නමුත් පහල අධිකරණයන් පූර්වාදර්ශ මගින් බැඳී සිටින බව ඔහුට පවසා ඇත. පෙරේරා එ. පෙරේරා යන නඩුව පිළිබඳ ඔහුට පවසා ඇත්තේ P, Q, R, සහ E යන කරුණු මත පදනම්ව වර්තමාන අභියාචනාධිකරණය විසින් අසනු ලබන නඩුවකදී හෝ A, B, C, සහ D යන කරුණු මත පදනම්ව දිසාඅධිකරණය විසින් තීරණය කරනු ලබන නඩුවකදී හෝ පෙරේරා එ පෙරේරා නඩු තීරණය අධි තීරණය කල නොහැකි බවයි. තවද ඔහු විසින් කියවන ලද තවත් නඩුවකදී වර්තමාන දිසාඅධිකරණය විසින් තීරණය කරනු ලබන A, B, E, සහ F කරුණු මත පදනම්වූ නඩුවකදී පෙරේරා එ පෙරේරා අනුගමනය කරනොමැත.

   1980 දී ශ්‍රේෂ්ඨාධිකරණය විසින් දෙන ලද A, B, C, සහ D යන කරුණු මත පදනම් වූ තීරණයක් සළකා බැලීමට පෙරේරා එ. පෙරේරා යන නඩුව තීරණය කිරීමේදී අභියාචනාධිකරණය අපොහොසත්ව ඇති බවත් එම නඩුවට ප්‍රතිවිරුද්ධ තීරණයක් අභියාචනාධිකරණය විසින් දී ඇති බවත් ප්‍රියා අනාවරණය කර ගෙන ඇත. මෙය පෙරේරා එ පෙරේරාහි වලංගුභාවයට කෙසේ බලපාන්නේද යන්න පිළිබඳව ඔහු තුල අවිශ්වාසයක් පවතී.

   අධිකරණ පූර්ව නිදර්ශන න්‍යාය ඉහත සඳහන් අවස්ථාවලදී ක්‍රියාත්මක වූයේ කෙසේද යන්න පිළිබඳව ව්‍යාකුල බවක් ප්‍රියා තුළ ඇති බැවින් ඒ සම්බන්ධයෙන් ඔබගේ උපකාර පතයි.

   සුදුසු උදාහරණ ඇසුරින් ඉහත අවස්ථාවන් ප්‍රියාට පැහැදිලි කරන්න.

- සියළුම හිමිකම් ඇවිරිණි -